280

අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය
සිංහල භාෂා ඒකකය

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023
## පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..............................................................................................
(මුල් අකුරු සමග නිවැරදි ව ලියන්න)

02. විද්‍යාලයේ නම සහ ලිපිනය : ...................................................................................

03. පාසල් වර්ගය : 200ට අඩු / 201-500 තෙක් /500ට වැඩි

04. කලාපය : ...............................................................................

05. පළාත : .................................................................................

---

## භාෂා භාවිතය හා අවබෝධය

**8 ශ්‍රේණිය** **කාලය : පැය 02යි.**

**I , II** කොටස්වල ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

### I වැනි කොටස

1. පහත එක් එක් පේළියේ ඇති නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කළමනාකරණය / කලමනාකරණය
(ii) නිශ්චල/ නිශ්වල
(iii) ප්‍රතිපල / ප්‍රතිඵල
(iv) ගවේශන / ගවේෂණ
(v) භික්ෂුණී / භික්ෂුනී
(vi) ප්‍රහර්ෂය / ප්‍රහර්සය
(vii) මර්දනය / මර්ධනය
(viii) ගැටලු / ගැටළු
(ix) කෘත්‍රීම / කෘත්‍රිම
(x) විශිෂ්ට / විශිෂ්ඨ

(ලකුණු 1 x 10 = 10 යි)

2. වරහන් තුළින් සුදුසු පද තෝරා හිස්තැන්හි යොදන්න.

(i) ආරාධිත අමුත්තෝ පොල්තෙල් ....................................................දැල්වූහ.( පහණ / පහන)
(ii) ගුණ ...................................පිරි ශිෂ්‍ය පරපුරක් බිහි කිරීම යුගයේ අවශ්‍යතාවකි. (නුවණින් /නුවනින්)
(iii) නිවාස යෝජනා ක්‍රමයේ වූ ජල ..................................................පද්ධතිය විනාශ වී ඇත. (නල/නළ)
(iv) හිරු...........................................................පතිත වෙත් ම අන්ධකාරය පහ විය. (කිරන/කිරණ)
(v) වහා ගිනි ගන්නා ........................................... බව රටයේ ම සඳහන් කර තිබිණි. (සුලු / සුළු)

(ලකුණු 1 x 5 = 05 යි)

3. පහත පදවල අර්ථය ලියන්න.

(i) පුරාණෝක්ති - ..............................................................................................
(ii) විජිතය - ..............................................................................................

(iii) අවශේෂ - ..............................

(iv) අනතිමාන - ..............................

(v) බහුශ්‍රැත - ..............................

(ලකුණු 1 x 5 = 05 යි)

4. (අ) පහත පදවලට විරුද්ධාර්ථවත් පද ලියන්න.

(i) ආධුනික - ..............................

(ii) අනුලෝම - ..............................

(iii) ශාන්තිය - ..............................

(iv) මෘදු - ..............................

(v) කේවල - ..............................

(ලකුණු 1 x 5 = 05 යි)

(ආ) පහත පදවලට සමානාර්ථවත් පද ලියන්න.

(i) අනවරත - ..............................

(ii) ශ්වේත - ..............................

(iii) රුපු - ..............................

(iv) ධරණි - ..............................

(v) ඉඳුවර - ..............................

(ලකුණු 1 x 5 = 05 යි)

5. පහත දැක්වෙන ඉඟි වැකිවල අර්ථය ලියන්න.

(i) අත දෙනවා - ..............................

(ii) අකුල් හෙළනවා - ..............................

(iii) සායම ගියා - ..............................

(iv) දෙහි කපනවා - ..............................

(v) කරල පැහිලා - ..............................

(ලකුණු 1 x 5 = 05 යි)

6. පහත් පද අයත් ක්‍රියා වර්ගය දක්වා එම පද යොදා වාක්‍යය බැගින් සාදන්න.

(i) පැමිණ - .............. ..............................

(ii) දුවමින් - .............. ..............................

(iii) කරනු මැනවි - .............. ..............................

(iv) සැනසෙත්වා - .............. ..............................

(v) කිය කියා - .............. ..............................

(ලකුණු 2 x 5 = 10 යි)

CamScanner

7. (අ) පහත දැක්වෙන බහුවචන සඳහා යෙදෙන අරුත් දෙක බැගින් ලියන්න.

(i) තිර - .............................. ..............................

(ii) පිය - .............................. ..............................

(iii) ඉසුරු - .............................. ..............................

(ආ) පහත පද සඳහා තනිපද ලියන්න.

(i) හේතුව අනුව යමක් සිතා ගැනීම - ..............................

(ii) සුපරීක්ෂාකාරීව බැලීම - ..............................

(ලකුණු 1 x 5 = 5 යි)

8. උක්ත ආඛ්‍යාතය පද සම්බන්ධය නිවැරදි වන සේ වරහනින් තෝරා ගත් පිළිතුරු යටින් ඉරක් අඳින්න.

(i) මම ඊයේ අලුයම ක්‍රීඩා පුහුණුවීම්වල .............................. (යෙදෙමි/යෙදුණෙමි)

(ii) අම්මා ද මම ද ගමනක් ..............................(යමු/යමි.)

(iii) තුරු පෙළ අහසේ ..............................(බබළති/බබළයි)

(iv) .............................. ගුවන අරා සිටිති. (කුරුල්ලන්/කුරුල්ලෝ)

(v) ඇතැමෙක් තුති ගී ..............................(ගැයූහ/ගැයුවේ ය)

(vi) .............................. හොඳින් ක්‍රීඩා කළෝ ය. (ඔවුහු/ඔවුන්)

(vii) .............................. සේවා ස්ථානයට පැමිණියා ය. (සේවිකාව/සේවිකාවක)

(viii) .............................. මවු ඇකයේ නිදයි. (බිළිඳා/බිළින්දෝ)

(ix) නාහිමියෝ ආරාමයට .............................. (වඩියි/වඩිති)

(X) .............................. වේගයෙන් ගලා බසිති (නදිය/නදීහු)

(ලකුණු 1 x 10 = 10 යි)

## II කොටස

9. පහත පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) කාසි තිබෙන දා හිනැහී ළඟට එතී
දැස වුව උගුල්ලා නොපැකිළව දෙතී
කාසි නොමැති දා බිව් පැන් මතක නැතී
මාස පෝයදා සඳ මෙන් සැඟව යතී

(2) පැදුරේ සිටින කල සගයින් වැලඳ ගතී
උස් පුටු ලැබුණු කල යන්තම් සිනහ සෙතී
නපුරු විපතකදී සැඟවෙති පලා යතී
බිතු සිතුවම් විලස ගොළු වෙති නිහඬ වෙතී

(3) ළබැඳි පෙමින් බැඳෙමින් සකි සඳුන් ලෙදා
කලණ මිතුරු දුකෙහිත් ළඟ සිටිති රඳා
විදුර පඬි විලස හදවත වුව ද පුදා
විපතෙ වැටුණු සුමිතුරු සුරකිය සදා



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

(i) කාසි තිබෙන දා කෙරෙන කාර්යයන් දෙකක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

(ii) මාස පෝයදා සඳ මෙන් සැඟව යන්නේ කිනම් අවස්ථාවේදී ද?

..............................................................................................................

(iii) යන්තමට සිනාසෙන්නේ කිනම් කලක ද?

..............................................................................................................

(iv) පද්‍යයට අනුව කලණ මිතුරකුගේ ලක්‍ෂණ දෙකක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

(v) මෙහි ඇති උපමාවක් හා උපමේයක් දක්වන්න.

උපමාව - ..............................................................................................

උපමේය - ..............................................................................................

(ලකුණු 4 x 5 = 20 යි)

10. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාවෙහි පළමුවෙන් ම පහළ වුණු ආරාමය අනුරාධපුර මහමෙවුනා උයනෙහි දෙවනපෑතිස් රජු කරවූ තිස්සාරාමය යි. පසු කලෙක මහාවිහාරය බවට පෙරළුණේ මේ ආරාමය යි. මුල්දී මෙහි වූයේ භික්ෂු ආවාසය සඳහා කරවන ලද කාලපාසාද පිරිවෙණ නම් මැටි ගෙයක් පමණ ය. පසු විටෙක, රජු හා ඇමතියන් විසින් භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා මහමෙවුනා උයනෙහි තවත් ගෙවල් කිහිපයක් සාදවන ලදි. චෛත්‍යය ලංකාවේ ආරාමයක අංගයක් බවට පත් වුණේ ථූපාරාමය කරවීමෙන් පසුව ය. බෝධිය ද එහි ම අංගයක් වූයේ බුද්ධගයාවෙන් වැඩම කරවූ ශ්‍රී මහා බෝධීන් ශාඛාව මහමෙවුනා උයනෙහි රෝපණය කිරීමෙන් පසුව ය. සිද්ධීන් දෙක ම වූයේ දේවානම් පියතිස්ස සමයෙහි දී ය. මේ කාලයේ දී ම රුහුණු රටෙහි ද දිවයිනේ සෙසු පළාත්වල ද විශාල ආරාම පහළ වෙන්ට පටන් ගති.

(i) ලංකාවේ ඉදිවුණ පළමුවන ආරාමය කුමක් ද?

..............................................................................................................

(ii) එම ආරාමය පසු කලෙක හැඳින්වූයේ කුමන නමකින් ද?

..............................................................................................................

(iii) චෛත්‍යය ලංකාවේ ආරාමයක අංගයක් බවට පත් වූයේ කුමන අවස්ථාවකින් පසුව ද?

..............................................................................................................

(iv) කාලපාසාද පිරිවෙණෙහි විශේෂත්වය කුමක් ද?

..............................................................................................................

(v) චෛත්‍යය ද බෝධිය ද ලංකාවේ ආරාමයක අංග බවට පත් වූයේ කුමන රජතුමාගේ කාලයේ දී ද?

..............................................................................................................

PAST PAPERS WIKI

(ලකුණු 4 x 5 = 20 යි)


WWW.PastPapers.WiKi (4)

CamScanner